කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය

# GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි

Issued by Forecasting Division, National Meteorological Centre

**2024 මැයි මස 21 දින සඳහා කාලගුණ අනාවැකිය**
**2024 මැයි මස 20 දින මධ්‍යහන 12.00 ට නිකුත්කරන ලදි.**

**නිරිත දිග මෝසම් තත්ත්වය දිවයින හරහා ක්‍රමයෙන් ස්ථාපිත වෙමින් පැවතීම හේතුවෙන් පවතින වැසි සහ සුළං තත්ත්වය තවදුරටත් බලාපොරොත්තු වේ.**

දිවයිනේ බොහෝ ප්‍රදේශවල අහස වළාකුලින් බරව පවතිනු ඇත.

බස්නාහිර, සබරගමුව, මධ්‍යම, වයඹ, දකුණු සහ උතුරු පළාත්වල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.

බස්නාහිර, සබරගමුව, වයඹ පළාත්වලත් ගාල්ල, මාතර, මහනුවර, නුවරඑළිය සහ මන්නාරම දිස්ත්‍රික්කවලත් ඇතැම් ස්ථානවල **මි.මී. 100 ට වැඩි** තද වැසි ඇතිවිය හැක.

උතුරු-මැද පළාතේ වැසි වාර කිහිපයක් ඇති වේ.

දිවයින හරහා විටින් විට හමන **පැ.කි.මී. (30-40)** ක පමණ තරමක තද සුළං ඇතිවිය හැක.

**ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මඟින් සිදු වන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

## WEATHER FORECAST FOR 21 May 2024
## Issued at 12.00 noon on 20 May 2024

**Due to South-West monsoon conditions are gradually establishing across the island, prevailing showery and windy conditions will continue further.**

Cloudy skies can be expected over most parts of the island.

Showers or thundershowers will occur at times in Western, Sabaragamuwa, Central, North-western Southern and Northern provinces.

Heavy showers **above 100mm** are likely at some places in Western, Sabaragamuwa and North-western provinces and in Galle, Matara, Kandy, Nuwara-Eliya and Mannar districts.

Several spells of showers will occur at North-central province.

Fairly strong winds about **(30-40) kmph** can be expected at times over the island.

**General public is kindly requested to take adequate precautions to minimize damages caused by temporary localized strong winds and lightning during thundershowers.**

Rainfall amount (mm): Light: 00-12.5, Light to moderate: 12.5-25, Moderate: 25-50, Fairly heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.5, සිහින් හෝ මද වැසි: 12.5-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය

## GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි

Issued by Forecasting Division, National Meteorological Centre

### ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය
### 2024 මැයි මස 20 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.

**වැසි තත්ත්වය:**

මන්නාරම සිට කොළඹ සහ ගාල්ල හරහා හම්බන්තොට දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවන අතර ඇතැම් ස්ථානවල තද වැසිද ඇති විය හැක. දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

**සුළඟ:**

කල්පිටිය සිට කොළඹ, ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළං බස්නාහිර සිට නිරිත දක්වා වන දිශාවලින් හමන අතර සුළං වේගය පැ.කි.මී. (40-50) පමණ වේ, මෙම මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට **පැ.කි.මී. (60-70)** දක්වා වැඩි විය හැක.

දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශවල සුළං නිරිත දෙසින් හමා එන අතර සුළං වේගය පැ.කි.මී. (25-35) පමණ වන අතර සුළඟේ වේගය විටින් විට **පැ.කි.මී. 50** දක්වා වැඩි විය හැක.

**මුහුදේ ස්වභාවය:**

කල්පිටිය සිට කොළඹ, ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශ විටින් විට ඉතා රළු වන අතර සෙසු මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළු විය හැක.
කල්පිටිය සිට කොළඹ, ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල මුහුදු රළ උස මීටර් (2.5 – 3.0) ක් පමණ ඉහළ යාමේ හැකියාවක් පවතී. ( මෙය ගොඩබිමට එන රළ උස නොවේ )

**මේ පිළිබඳ සිය අවධානය යොමු කරන ලෙස ධීවර හා නාවික ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.**

**ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.**

### WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS
### Issued at 12.00 noon on 21 May 2024.

**Condition of Rain:**

Showers or thundershowers will occur at times in the sea areas extending from Mannar to Hambantota via Colombo and Galle, heavy showers are likely at some places. Showers or thundershowers will occur at several places in the other sea areas around the island.

**Winds:**

Winds will be westerly to south-westerly in the sea areas extending from Kalpitiya to Pottuvil via Colombo, Galle and Hambantota and wind speed will be **(40-50) kmp.** Wind speed may increase up to (**60-70) kmph** at times these sea areas.

Winds will be south-westerly and wind speed will be (25-35) kmph and can be increased up to **50 kmph** at times in the other sea areas around the island.

**State of Sea:**

The sea areas extending from Kalpitiya to Pottuvil via Colombo, Galle and Hambantota will be very rough at times and other sea areas around the island will be fairly rough at times.
The swell waves (about 2.5 m – 3.0 m) height (This is not for land area) may increase in the sea areas off the coast extending from Kalpitiya to Pottuvil via Colombo, Galle, and Hambantota.

**Naval and fishing communities are also requested to be attentive in this regard.**

**Temporarily strong gusty winds and very rough seas can be expected during thundershowers.**

Rainfall amount (mm): Light: 00-12.5, Light to moderate: 12.5-25, Moderate: 25-50, Fairly heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.5, සිහින් හෝ මද වැසි: 12.5-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි